0320

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

සමාජ අධ්‍යයන අංශය

තරුණ කටයුතු සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2021/2022) - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය - දෙවන වර්ෂ අර්ධය

**DSD3502 / SSD1202 –** තරුණ පෙළ සහ සමාජය

කාලය : පැය 02

---

දිනය - 2023/02/12 වේලාව – පෙ.ව 9.30 - පෙ.ව 11.30

---

උපදෙස් :-

- ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 කි.
- පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න.

01. සමාජය සහ ආර්ථිකය අතර සම්බන්ධය ඔබ නිර්වචනය කරන්නේ කෙසේද? ඕනෑම න්‍යායාත්මක පර්යාවලෝකයක් භාවිතා කරමින් සාකච්ඡා කරන්න.

02. පාසලේ සිට රැකියාව දක්වා සංක්‍රාන්ති කාලය යෞවනයන් සඳහා සංකීර්ණ කාල පරිච්ඡේදයකි. එම කාලය තුළ ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති බාධක මොනවාද? යන්න පැහැදිලි කරන්න.

03. යෞවනයන් තුළ ඇති වන භූමිකා ගැටුම් (Role conflict) සහ භූමිකා අත්හිටුවීම (Role discontinuity) පුද්ගලික සහ ආයතනික ගැටළු ඇති කළ හැකිය.

අ) භූමිකා ගැටුම සහ භූමිකාව අත්හිටුවීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කරන්න.

ආ) මෙම ගැටළු පුද්ගලික සහ ආයතනික සංවර්ධනයට බලපාන්නේ කෙසේද?

04. කාල් මාක්ස්ගේ දෘෂ්ටිවාදයට අනුව පවුල ධනේශ්වර වටිනාකම් පවත්වාගෙන යාම සඳහා සහය දක්වයි. තරුණයන් සමාජගත කිරීමේදී එය මතවාදීව සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

05. නව තාක්ෂණයේ බලපෑම තරුණ තරුණියන්ට අපරාධ ක්‍රියාකාරකම්වල යෙදීමට දැඩි ලෙස බලපා ඇත. පැහැදිලි කරන්න.

06. "බොහෝ සමාජ ප්‍රජා ව්‍යුහයේ හි (Community Structure) පරිහානියක් අත්විඳිමින් සිටී""

අ) "ප්‍රජාව" යන යෙදුම නිර්වචනය කරන්න.

ආ) ප්‍රජාවේ වෙනස්වීම් යෞවනයන්ගේ හැසිරීමට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

07. තරුණ තරුණියන් නීති විරෝධී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී ඇති බව නිරන්තරයෙන් වාර්තා වේ. මෙම ව්‍යසනයෙන් ඔවුන් වළක්වා ගැනීම සඳහා ඔබට කළ හැකි යෝජනා ඉදිරිපත් කරන්න.

*********සියලුම හිමිකම් ඇවිරිණි*********